ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/1/4/1/31 | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.03.10 |

ලේකම්,
ප්‍රධාන... අමාත්‍යාංශය,
දකුණු පළාත.

**1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බඳවා ගත් දකුණු පළාත් සංවර්ධන නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම සඳහා පැවැත්වෙන ජංගම සේවා වැඩසටහන.**

දකුණු පළාත තුළ සේවය කරනු ලබන දකුණු පළාත් සංවර්ධන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නිසි ලෙස නඩත්තු නොවීම හේතුවෙන් හා ආයතනික ප්‍රමාදයන් හේතුවෙන් පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ ආයතනික කටයුතු ප්‍රමාද වී තිබීම නිසා එම කටයුතු කඩිනම් කිරීම උදෙසා ජංගම සේවයක් පැවැත්වීමට අප විසින් තීරණය කොට ඇත.

02. ඒ අනුව පළමුව ඔබ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සෙසු සියළුම ආයතන සම්බන්ධ කරමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර එහිදී 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බඳවා ගත් දකුණු පළාත් සංවර්ධන නිලධාරීන්ගේ මෙතෙක් සේවයේ ස්ථිර නොමැති නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම මූලික අරමුණ වේ.

03. ඒ අනුව, පහත පරිදි ජංගම සේවය පැවැත්වීමට තීරණය කර ඇත.

| ජංගම සේවය පැවැත්වෙන දිනය | ජංගම සේවය පැවැත්වෙන ස්ථානය | පැමිණිය යුතු වේලාව | පැමිණිය යුතු ආයතන |
|---|---|---|---|
| 2022.03.15 | මාතර සහකාර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය | පෙ.ව. 9.00 | මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ප්‍රධාන... අමාත්‍යාංශය යටතේ පවතින සියළුම පළාත් පාලන ආයතන |
| | | ප.ව 12.00 | මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල ප්‍රධාන... අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අනෙකුත් ආයතන |
| 2022.03.16 | දකුණු පළාත් ප්‍රධාන... අමාත්‍යාංශය | පෙ.ව. 9.00 | ගාල්ල දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන... අමාත්‍යාංශය යටතේ පවතින සියළුම පළාත් පාලන ආයතන ආයතන |
| | | ප.ව 12.00 | ගාල්ල දිස්ත්‍රික්කයෙහි ප්‍රධාන... අමාත්‍යාංශය යටතේ පවතින සියළුම අනෙකුත් ආයතන |

03. එබැවින් ඔබ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සෙසු සියළුම ආයතන ආයතනවල සේවයේ නියුතු 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බඳවා ගත් දකුණු පළාත් සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ ස්ථිර කිරීම සම්බන්ධ ආයතනික ගැටළු මේ සමඟ යොමු කරනු ලබන ආකෘති පත්‍රය ප්‍රකාරව සම්පූර්ණ කර

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

2022.03.11 දිනට පෙර මා වෙත ෆැක්ස් මාර්ගයෙන් (ෆැක්ස් අංකය - 0912246905) යොමු කිරීමට කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

05. ඒ අනුව, ඉහත ආකෘති පත්‍රය ප්‍රකාරව යොමු කරන ලද නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු රැගෙන අදාළ ආයතනවල මාණ්ඩලික නිලධාරියකු සමඟ විෂය නිලධාරියා අනිවාර්යෙන්ම අදාළ දිනයන්හි ඒ සඳහා සහභාගී කරවන ලෙසත් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත් දන්වා සිටිමි.

06. මෙම ජංගම සේවා වැඩසටහන ප්‍රමුඛ කාර්යයක් සේ සලකා එය සාර්ථක කර ගැනීමට උපරිම සහයෝගය ලබා දෙන ලෙසත් මේ පිළිබඳ සියළුම ආයතන දැනුවත් කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටින අතර මේ සම්බන්ධ වැඩි දුර තොරතුරු අවශ්‍ය වේ නම් 091-4944011 හා 091-4944003 යන දුරකථන අංක අමතන ලෙසත් දන්වා සිටිමි.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්:-

01. පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත - දැ.ගැ.පි.
02. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.
03. පළාත් ආයුර්වේද කොමසාරිස්, දකුණු පළාත...................... - දැ.ගැ.පි.
04. අධ්‍යක්ෂ ජනරාල්, දකුණු පළාත් සංවර්ධන අධිකාරිය - දැ.ගැ.පි.
05. දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ගාල්ල/මාතර/හම්බන්තොට - දැ.ගැ.පි.
06. පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල/මාතර/හම්බන්තොට - දැ.ගැ.පි.
07. නාගරික කොමසාරිස්, මහා නගර සභාව, ...................... - දැ.ගැ.පි.
08. ලේකම්, නගර සභාව, ........................ - දැ.ගැ.පි.
09. ලේකම්, ප්‍රාදේශීය සභාව, ........................... - දැ.ගැ.පි.
10. වෛද්‍ය අධිකාරී, මූලික රෝහල, ........................... - දැ.ගැ.පි.

## ආකෘති පත්‍රය

| නිලධාරියාගේ නම | ආයතනය | මුල් පත්වීම් දිනය | දකුණු පළාත් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වී ඇත/නැත | සේවයේ ස්ථිර නොවීම සම්බන්ධව පෞද්ගලික ලිපිගොනුවෙහි පවතින ගැටළු |
|---|---|---|---|---|
| | | | | |